**පොළොන්නරුව ප්‍රාදේශීය සභාව - 2022**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.327,540 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා උසාවි දඩ ආදායම රු.952,834 ක් අඩුවෙන් දක්වා තිබූ අතර, දෙසැම්බර් මාසයට අදාළ මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ වැලි ආදායම් රු.435,650 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.54,021 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් කර තිබුණු දේශීය ණය සංවර්ධන අරමුදල සඳහා ගෙවිය යුතු මුදල ලෙස රු.483,757 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මංමාවත් හා පාලම් බෝක්කු උපලේඛනය අනුව කඩවල මා ඔය බෝක්කුව සකස් කිරීමෙහි වටිනාකම රු.237,094 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | ස්ථාවර වත්කම්වල නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 145,201 ක් වූ විවිධ ණයහිමි වටිනාකම් 10 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශනවලට උපචිත පදනමින් වර්ෂයට අදාළ වියදම හඳුනාගත යුතුය. |
| (ඌ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියෙන් ලද ප්‍රතිපාදන මත ඉදිකර තිබූ රු. 5,237,499 ක් වටිනා වැවේතැන්න පිවිසුම් මාර්ගය ස්ථාවර වත්කම්වල දක්වා නොතිබුණි. | -එම- | වර්ෂයට අදාළ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (එ) | වැඩ අවසන් නොකළ විද්‍යුත් පුස්තකාල 08 හි වටිනාකම රු.14,163,825 ක් ලෙස දක්වා තිබුණද, නිමි ප්‍රතිශතය අනුව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වටිනාකම රු.13,723,979 ක් වූයෙන් රු.439,846 ක කෙරීගෙන යන වැඩ වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | ඉදිකිරීම් භෞතිකව නිම කළ ප්‍රතිශතය අනුව මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිශිෂ්ඨය 02 හි EG 2.7 ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.14,348,884 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | වර්ෂයට අදාළ ප්‍රාග්ධන වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | 2020 හා 2021 වර්ෂවල ලද ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉදිකළ වත්කම්/ මිළට ගන්නා ලද වත්කම්වල ක්ෂය කළ අනුපාතයන්ට අනුව වර්ෂයේ ආදායම හඳුනාගෙන නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන වලින් ඉදිකළ/ මිළට ගන්නා ලද වත්කම් ක්ෂය ගිණුම් තබන පදනම මත ආදායම හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘති කාර්යාලය මගින් 2021 මාර්තු 16 දින ලද රු.961,830 ක් වටිනා උපකරණ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | -එම- | පරිත්‍යාග ලෙස ලැබෙන භාණ්ඩ නිවැරදිව හඳුනාගෙන තොග පොත්වල දක්වා මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |
| (ක) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ජංගම නොවන වත්කම්වල දැක්විය යුතු රු.6,109,793 ක් වටිනා ගොඩනැගිලි 13 ක වටිනාකමද, මං මාවත් පාලම් හා බෝක්කු 41ක රු.25,420,174 ක වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | ස්ථාවර වත්කම් නිවැරදිව ලේඛනවල සටහන් කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් ලේඛනවල දක්වා ඇති ආදායම හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආදායම අතර රු.918,925 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදි වටිනාකම හඳුනාගෙන අනුරූපී වාර්තා හෝ ලේඛන නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් අතර රු.10,057,721 ක නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ලී බඩු උපලේඛනය අනුව ලී බඩු අයිතම 02 ක වටිනාකම රු.153,875 ක් ලෙස දක්වා තිබුණද, එහි නිවැරදි වටිනාකම රු.289,000 ක් වූයෙන් ලී බඩු උපකරණ වටිනාකම රු.135,125 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | ස්ථාවර වත්කම්වල නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සමාලෝචිත වර්ෂය අවසානයට බෙහෙත් ද්‍රව්‍ය වටිනාකම රු.452,498 ක් ලෙස දක්වා තිබුණද, ස්ථානභාර ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථන අනුව වටිනාකම රු.896,033 ක් වූ බැවින් රු.443,535 කින් තොග අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොග වටිනාකම දැක්විය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,343,457 ක් වූ ගිණුම් ශේෂ 04 ක් ශේෂ සනාථ කිරීම්, ලේඛන සහ උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂ තහවුරු කරගැනීමට අවශ්‍ය තොරතුරු පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.3,504,601 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයභාරය රු.13,086,784 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022<br>ඇස්තමේන්තුගත ආදායම<br>රු. | 2022<br>බිල් කළ ආදායම<br>රු. | 2022<br>රැස්කළ ආදායම<br>රු. | 2022<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | 2021<br>ඇස්තමේන්තුගත ආදායම<br>රු. | 2021<br>බිල් කළ ආදායම<br>රු. | 2021<br>රැස්කළ ආදායම<br>රු. | 2021<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 1,321,500 | 1,545,544 | 873,133 | 1,767,196 | 2,330,011 | 1,288,858 | 1,284,294 | 1,772,285 |
| (ii) | කුලී | 3,433,710 | 4,596,668 | 3,771,718 | 1,119,500 | 3,503,710 | 5,228,210 | 5,392,276 | 245,650 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 377,000 | 385,800 | 353,800 | 504,380 | 448,500 | 651,890 | 651,890 | - |
| (iv) | වෙනත් ආදායම් | 72,314,860 | 29,686,466 | 16,649,151 | 45,341,565 | 29,750,265 | 66,899,975 | 25,132,221 | 75,827,441 |
| | | 77,447,070 | 36,214,478 | 21,647,802 | 48,732,641 | 36,032,486 | 74,068,933 | 32,460,681 | 77,845,376 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **බලපත්‍ර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු හිඟය රු. 504,380 ක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ආදායම රු.174,320 ක් වූ අතර, එය වසර 06 කට අධික කාලයක සිට නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන ලේකම්වරයාගෙන් කපාහැරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති බව. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් නොපමාව නිරවුල් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කසල ගාස්තු ආදායම රු.647,500 ක් වූ අතර, මෙම වටිනාකමින් රු.574,500 ක් 2018 වර්ෂයේ සිට පවතින හිඟයක් විය. | -එම- | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු අනුව තෘතියික මට්ටමේ එක් පුරප්පාඩුවක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 07 ක් ද පැවති අතර, ප්‍රාථමික කාර්යය මණ්ඩලයේ එක් තනතුරක අතිරික්තයක් විය. | පවතින පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස පළාත් පාලන ආයතන වෙතින් ඉල්ලීම් කළ බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |